# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1733/52 - 2011 නොවැම්බර් 25 වැනි සිකුරාදා - 2011.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි 57 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 වැනි ව්‍යවස්ථාවේ නියමයන්ට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව -

1. මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව නියම කරනු ලැබ ඇති රජයේ නිලධරයන් සම්බන්ධයෙන්, මෙහි උපලේඛනයේ III තීරුවෙහි නිශ්චිතව නියම කරනු ලැබ ඇති, එම නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහකිරීම පිළිබඳව එකී කොමිෂන් සභාව සතු බලතල, මෙම උපලේඛනයේ II තීරුවෙහි නිශ්චිතව නියම කරනු ලැබ ඇති රජයේ නිලධරයන් වෙත, අමාත්‍ය මණ්ඩලය විසින් 2011-11-16 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී නිශ්චිතව නියම කරනු ලැබ ඇති පරිදි එකී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙයින් පවරා දෙනු ලැබේ.

   එසේ වුව ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරන ලද යම් බලතල පැවරීමක් සම්බන්ධයෙන් හෝ එකී කොමිෂන් සභාව විසින් එලෙස සිදුකරන ලද යම් බලතල පැවරීමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ කිසියම් ප්‍රශ්නයක් උද්ගතවන අවස්ථාවක දී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේය.

   තව ද, එසේ වුව ද, II වැනි තීරුවෙහි නිශ්චිතව නියමකරනු ලැබ ඇති රාජ්‍ය නිලධරයන් I තීරුවෙහි නිශ්චිතව නියම කරනු ලැබ ඇති රාජ්‍ය නිලධරයෙකුට එරෙහිව යම් විනය පරීක්ෂණයක දී පැමිණිලිකරුවෙකු හෝ සාක්ෂිකරුවෙකු හෝ විභව්‍ය සාක්ෂිකරුවෙකු හෝ වන්නේ නම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, තමන් විසින් සිදුකරනු ලැබ තිබිය හැකි බලතල පැවරීම් කිසිවක් නොසලකා, මෙහි උපලේඛනයේ III තීරුවෙහි නිශ්චිතව නියමකරනු ලැබ ඇති පරිදි පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, විනය පාලනය කිරීමේ හා සේවයෙන් පහකිරීමේ බලය, ඒ සම්බන්ධයෙන් කිසිදු බලතල පැවරීමක් සිදුකර නොමැති සේ සලකා නොකඩවා ක්‍රියාත්මක කළයුතු වන්නේය.

2. කොමිෂන් සභාව විසින් රජයේ නිලධරයෙකු වෙත මෙයින් පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීමේ දී එම රජයේ නිලධරයා විසින් ගනු ලබන සියලු තීරණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 වැනි ව්‍යවස්ථාවේ විධි විධානවලට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බවට එකී කොමිෂන් සභාව විසින් මෙයින් නිශ්චිතව නියම කරනු ලැබේ.

3. ඉහත කී බලතල පවරනු ලැබ ඇත්තේ යම් රජයේ නිලධරයන් වෙත ද, එම රජයේ නිලධරයන් විසින් තමන් වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ සියලු අවස්ථාවන්හි දී, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 ආ සහ 58 (1) යන ව්‍යවස්ථා ප්‍රකාරව සාදන ලද රාජ්‍ය නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටික රීතිවලට මෙන්ම එකී කොමිෂන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන යම් කොන්දේසි, රීති, නියෝග සහ වෙනත් කාර්ය පටිපාටිවලට ද අනුකූලව ක්‍රියාකල යුතු බවට එකී කොමිෂන් සභාව විසින් මෙයින් නිශ්චිත ව නියම කරනු ලැබේ.

එසේ වුව ද, රාජ්‍ය සේවයට අදාළව එකී කාර්ය පටිපාටික රීති මගින් විධි විධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් වූ යම් රීති, නියෝග හෝ කාර්ය පටිපාටි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන තුරු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහ අට වන සංශෝධනය ක්‍රියාත්මක වීමේ දිනට බලාත්මකව පැවතියා වූ රාජ්‍ය සේවය හා සම්බන්ධ අනෙකුත් සියලුම රීති, නියෝග හා කාර්ය පටිපාටි, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එකී කොමිෂන් සභාව විසින් පනවනු ලැබ හෝ විධි විධාන සලසනු ලැබ ඇති රීති, නියෝග හා කාර්ය පටිපාටි ලෙස සලකා නොකඩවා බලාත්මක විය යුතු අතර, ඒවා රාජ්‍ය සේවය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති බලතල, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර නොමැති රජයේ නිලධරයන් සම්බන්ධයෙන්, එම කොමිෂන් සභාව විසින් සෘජුවම ක්‍රියාත්මක කරනු ලබනවා ඇත.

5. මෙම බලතල පැවරීම 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු බවටත්, එකී දිනයේම සිට ක්‍රියාත්මක වන පරිදි, 2003 ජුලි මස 2 වැනි දිනැතිව අංක 1295/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පළ කරන ලද බලතල පැවරීමත්, 2006 ජුනි මස 13 වැනි දිනැතිව අංක 1449/12 දරන අති *විශෙෂ ගැසට් පත්‍රයෙහි* ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පළ කරන ලද බලතල පැවරීමත්, පූර්වෝක්ත *ගැසට් පත්‍රවල* පළ කරන ලද බලතල පැවරීම යටතේ ගන්නා ලද හෝ ගනු ලබනු ඇතැයි සැලකෙන යම් ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි ප්‍රත්‍යාදිෂ්ට වන බවටත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙයින් නිශ්චිතව නියම කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ටී.එම්.එල්.සී.සේනාරත්න,  
ලේකම්,  
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2011 නොවැම්බර් මස 25 වැනි දින දී ය.  
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,  
177, නාවල පාර, නාරාහේන්පිට,  
කොළඹ 05.

උපලේඛනය

*I කොටස*

## *බලතල පැවරීම - ශ්‍රී ලංකා පොලිස් සේවයේ නිලධාරීන් හැර, අනෙකුත් රාජ්‍ය නිලධාරීන්*

<table>
<tr><th>I තීරුව<br>නිලධාරී ගණය</th><th>II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්</th><th>III තීරුව<br>පවරන ලද බලතල</th></tr>
<tr><td>1. පහත සඳහන් දීපව්‍යාප්ත සේවාවන්වල I පන්තියට හෝ I ශ්‍රේණියට අයත් සහ ඊට ඉහළ නිලධාරීන්<br><br>(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය.<br>(ආ) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය.<br>(ඇ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය.<br>(ඈ) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය.</td><td>රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්</td><td rowspan="2">(I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br><br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් පිළිබඳ විනය පාලනය.<br><br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම.</td></tr>
<tr><td>(ඉ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය.</td><td>අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්</td></tr>
</table>

උපලේඛනය (සම්බන්ධයි)

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| (ඊ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය. | භාණ්ඩාගාරයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් පිළිබඳ විනය පාලනය.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |
| (උ) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය. | ක්‍රමසම්පාදන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් / අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබූ, අතිරේක ලේකම් තනතුරට වඩා පහළ තනතුරක නොවන, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නිලධරයෙකු. | |
| (ඌ) ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය. | පශු සම්පත් සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්. | |
| (එ) ශ්‍රී ලංකා වෛද්‍ය සේවය. | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්. | |
| (ඒ) ශ්‍රී ලංකා දේශීය වෛද්‍ය සේවය. | දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්. | |
| (ඔ) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය. | ඉඩම් මැනුම් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්. | |
| (ඕ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය. | කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්. | |
| 2. පහත දැක්වෙන දීපව්‍යාප්ත සේවාවන්වලට අයත් I පන්තියට හෝ I ශ්‍රේණියට පහළ නිලධාරීන්<br>(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය.<br>(ආ) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය.<br>(ඇ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය.<br>(ඈ) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය. | රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් පිළිබඳ විනය පාලනය.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |
| (ඉ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය. | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | |
| (ඊ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය. | භාණ්ඩාගාරයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු. | |
| (උ) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය. | ක්‍රමසම්පාදන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබූ, අතිරේක ලේකම් තනතුරට වඩා පහළ තනතුරක නොවන, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නිලධරයෙකු. | |

උපලේඛනය (සම්බන්ධයි)

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| (ඌ) ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය. | පශු සම්පත් සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් පිළිබඳ විනය පාලනය.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |
| (එ) ශ්‍රී ලංකා වෛද්‍ය සේවය. | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබූ, අතිරේක ලේකම් තනතුරට වඩා පහළ තනතුරක නොවන, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නිලධරයෙකු. | |
| (ඒ) ශ්‍රී ලංකා දේශීය වෛද්‍ය සේවය. | දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | |
| (ඔ) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය. | ඉඩම් මැනුම් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් /අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | |
| (ඕ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය. | කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් /අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | |
| 3. දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති I පන්තියේ සහ ඊට ඉහළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන්. | අදාළ අමාත්‍යාංශයේ ලේකම් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවැනි උප ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් පිළිබඳ විනය පාලනය.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |
| 4. දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති I පන්තියට පහළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන්. | අදාළ අමාත්‍යාංශයේ ලේකම්/ අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවැනි උප ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් පිළිබඳ විනය පාලනය.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |

උපලේඛනය (සම්බන්ධයි)

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| 5. දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන සහ අමාත්‍යාංශයක් යටතේ නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන්. | අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවැනි උප ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් පිළිබඳ විනය පාලනය.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |
| 6. අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නිලධරයන්. | අදාළ අමාත්‍යාංශයේ ලේකම්/ අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවැනි උප ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් පිළිබඳ විනය පාලනය.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |
| 7. අමාත්‍යාංශයක් යටතේ නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ/විශේෂ ශ්‍රේණියේ නිලධරයන්. | අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ දෙවැනි උප ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් පිළිබඳ විනය පාලනය.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |
| 8. අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නිලධරයන් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ නිලධරයන්. | අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි/සේවා ව්‍යවස්ථාවලට අනුකූලව පත්කිරීම සහ උසස් කිරීම.<br>(II) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථානමාරු කිරීම.<br>(III) විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම. |

උපලේඛනය (සම්බන්ධයි)

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| 9. ඒකාබද්ධ සේවාවන්ට අයත්, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන්. | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි/සේවා ව්‍යවස්ථාවලට අනුකූලව පත්කිරීම සහ උසස් කිරීම.<br>(II) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(III) විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම. |
| 10. ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අර්ථනිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන්. | අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි/සේවා ව්‍යවස්ථාවලට අනුකූලව පත්කිරීම සහ උසස් කිරීම.<br>(II) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථානමාරු කිරීම.<br>(III) විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම. |
| 11. ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ සිවිල් පරිපාලනය යටතේ ගැනෙන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ, ද්විතීයික මට්ටමේ සහ තෘතීය මට්ටමේ නිලධරයන්. | ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ සිවිල් පරිපාලනය භාර නිලධරයා. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි/සේවා ව්‍යවස්ථාවලට අනුකූලව පත්කිරීම සහ උසස් කිරීම.<br>(II) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථානමාරු කිරීම.<br>(III) විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම. |
| 12. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ වන ජාතික පාසල්වලට හෝ ආයතනවලට අයත් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I පන්තියේ නිලධරයන් සහ ජාතික පාසල්වල විදුහල්පතිවරුන්. | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි පිළිබඳ විනය පාලනය.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |

උපලේඛනය (සම්බන්ධයි)

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| 13. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ වන ජාතික පාසල්වල හෝ ආයතනවල පහත සඳහන් ගණයන්ට අයත් නිලධරයන්:<br>(අ) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියට පහළ නිලධරයන්.<br>(ආ) ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන්.<br>(ඇ) ජාතික පාසල්වල හෝ අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ ගැනෙන ආයතනවල, ඒකාබද්ධ සේවාවන්ට හෝ මෙම උපලේඛනයේ සඳහන් වෙනත් කවර හෝ ගණයන්ට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ, ද්විතියික මට්ටමේ සහ තෘතීය මට්ටමේ නිලධරයන්. | (1) අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි/සේවා ව්‍යවස්ථාවලට අනුකූලව පත්කිරීම සහ උසස් කිරීම.<br>(II) විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම. |
| | (2) අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්/අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි පිළිබඳ විනය පාලනය<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |
| 14. ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ අධි පන්තියේ නිලධාරීන්. | ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් පිළිබඳ විනය පාලනය<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |

උපලේඛනය (සම්බන්ධයි)

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| 15. ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ අධි පන්තියට පහළ නිලධාරීන්. | (1) ස්වදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි / සේවා ව්‍යවස්ථාවලට අනුකූලව පත් කිරීම සහ උසස් කිරීම.<br>(II) විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම. |
| | (2) ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටි වලට අනුකූලව දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කිරීම.<br>(II) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |
| | (3) අදාළ දිස්ත්‍රික් ලේකම් / දිසාපති | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව අදාළ පරිපාලන දිස්ත්‍රික්කය තුල ස්ථාන මාරු කිරීම.<br>(II) **සේවයෙන් පහ කිරීම හැර,** විනය පාලනය.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |
| | (4) අදාළ ප්‍රාදේශීය ලේකම්/උප දිසාපති | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව අදාළ ප්‍රාදේශීය ලේකම් /උප දිසාපතිගේ බල ප්‍රදේශය තුළ ස්ථාන මාරු කිරීම. |

*II කොටස*

## බලතල පැවරීම - ශ්‍රී ලංකා පොලිස් සේවයේ/ පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්

| I තීරුව<br>නිලධාරී වර්ග | II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| 1. සහකාර පොලිස් අධිකාරි සහ ඊට ඉහළ නිලයන්. | රාජ්‍ය ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරුකිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි පිළිබඳ විනය පාලනය.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |
| 2. ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථානභාර නිලධාරීන් ඇතුළුව)<br>සංවර්ධන සහකාර<br>පොලිස් ආරක්ෂක සහකාර<br>සිවිල් සහායක සේවයේ නිලධරයන්.<br>ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (ඇමුණුම II) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන්. | පොලිස්පති | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි/සේවා ව්‍යවස්ථාවලට අනුකූලව පත් කිරීම සහ උසස් කිරීම.<br>(II) පරිවාස කාලය තුළ දී පත්වීම අවලංගු කිරීම හෝ සේවය අවසන් කිරීම.<br>(III) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරුකිරීම.<br>(IV) විනය පාලනය හා සේවයෙන් පහ කිරීම.<br>(V) වැඩ තහනම් කිරීම. |
| 3. ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්.<br>සංවර්ධන සහකාර<br>පොලිස් ආරක්ෂක සහකාර<br>සිවිල් සහායක සේවයේ නිලධරයන්.<br>ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (ඇමුණුම II) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන්. | (1) පොලිස්පති<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) | (I) පරිවාස කාලපරිච්ඡේදයෙන් හෝ වැඩ බැලීමේ කාලපරිච්ඡේදයෙන් පසු සේවයේ ස්ථිර කිරීම.<br>(II) සේවයෙන් ඉල්ලා අස්වීමේ ලිපි පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම.<br>(III) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම. |

| I තීරුව<br>නිලධාරී වර්ග | II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්.<br>සංවර්ධන සහකාර<br>පොලිස් ආරක්ෂක සහකාර<br>සිවිල් සහායක සේවයේ නිලධරයන්.<br>ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (ඇමුණුම II) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන්. | (2) පොලිස්පති<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (සිය පරිපාලන කොට්ඨාසය තුළ) | (I) නිලධරයෙකු ඊළඟ ඉහළ නිලයට හෝ ශ්‍රේණියට හෝ තනතුරට උසස් කිරීමෙන් අනතුරුව, ඔහුගේ එක් වසරකට වැඩි කාලයක අනිවාර්ය වැඩ බැලීමේ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීම.<br>(II) කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතා සම්පූර්ණ කිරීම පිණිස, උපරිම වශයෙන් වසර තුනක කාලයක් දක්වා පරිවාස කාලපරිච්ඡේදය දීර්ඝ කිරීම. |
| | (3) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට අයත් පරිපාලන කොට්ඨාසය තුළ ස්ථාන මාරු කිරීම. (ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් සහ පොලිස් ස්ථානභාර නිලධාරීන් හැර)<br>(II) පහත සඳහන් කරුණු, එනම් ;<br>i. සේවයෙන් පහ කිරීම;<br>ii. පරිවාස කාලය තුළ පත්වීම අවලංගු කිරීම හෝ සේවය අවසන් කිරීම; සහ<br>iii. සේවය හැරයාමේ නියෝගයන්ට එරෙහි වන අභියාචනා සළකා බැලීම;<br>හැර, ඔවුන්ගේ පරිපාලන බල ප්‍රදේශ තුළ විනය පාලනය (ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් හැර). |
| | (4) නියෝජ්‍ය පොලිස්පති | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව නියෝජ්‍ය පොලිස්පතිවරයාට අදාළ පරිපාලන කොට්ඨාසය තුළ ස්ථාන මාරු කිරීම. (ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් සහ පොලිස් ස්ථානභාර නිලධාරීන් හැර). |

| I තීරුව<br>නිලධාරී වර්ග | II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| 4. පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්.<br>සංවර්ධන සහකාර<br>පොලිස් ආරක්ෂක සහකාර<br>සිවිල් සහායක සේවයේ නිලධරයන්.<br>ඒකාබද්ධ සේවා වලට අයත් නොවන අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (ඇමුණුම II) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන්. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (පොලිස් අධිකාරි I ශ්‍රේණිය)<br>පොලිස් අධිකාරි | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (පොලිස් අධිකාරි I ශ්‍රේණිය) / පොලිස් අධිකාරි පරිපාලන කොට්ඨාසය තුළ ස්ථාන මාරු කිරීම. (පොලිස් ස්ථාන භාර නිලධරයන් හැර). |
| 5. පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්.<br>සංවර්ධන සහකාර<br>පොලිස් ආරක්ෂක සහකාර<br>සිවිල් සහායක සේවයේ නිලධරයන්<br>ඒකාබද්ධ සේවා වලට අයත් නොවන අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (ඇමුණුම II) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන්. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති<br>නියෝජ්‍ය පොලිස්පති<br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (පොලිස් අධිකාරි I ශ්‍රේණිය)<br>පොලිස් අධිකාරි<br>සහකාර පොලිස් අධිකාරි | අදාළ පරිපාලන බල ප්‍රදේශය තුළ වැඩ තහනම් කිරීම.<br>අදාළ පරිපාලන බල ප්‍රදේශය තුළ විනය ශාලා දඬුවම්. |

12 - 472

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.